# කොරියානු රැකියාවක් සඳහා නැවත එරටට (Re-entry Workers) යාමට බලාපොරොත්තුවෙන් සිටින රැකියා අපේක්ෂකයින් වෙත කරනු ලබන විශේෂ නිවේදනයයි.

ශ්‍රී ලංකාව සහ කොරියාව අතර ඇති අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් කොරියානු රටෙහි වසර 04 මාස 10 කොන්ත්‍රාත් කාලයක් සඳහා රැකියාවලට පිටත්කර යැවූ අයට ආපසු පැමිණීමෙන් පසු නැවත එම රැකියාව සඳහා කොරියාවට පිටත්කර යැවීමේ වැඩ පිළිවෙළ කාර්යාංශය මඟින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ සඳහා කොරියාවේ මානව සම්පත් ආයතනය මඟින් ලබාගත් උපදෙස් පරිදි පහත සඳහන් දැනුම්දීම් ඔබවෙත සිදු කරනු ලැබේ.

ඒ අනුව,එම සේවා ස්ථාන වෙත පිටත්වීමට අපේක්ෂාවෙන් 2020.04.01 දිනට පෙර සේවා ගිවිසුම් අත්සන් කරන ලද රැකියාලාභීන්ව පිටත් කරවීම සඳහා නිරෝධායන ක්‍රියාවලියට සේවා යෝජකයා එකඟවිය යුතු මෙන්ම එම සේවා යෝජකයා විසින් දින 14 ක නිරෝධානයක්,නිරෝධායන නීති වලට අනුව ලබාදිය යුතුය.එම නිරෝධායනය ඔබ වෙත ලබාදීමට ඔබගේ සේවා යෝජකයන්ට හැකිද යන්න කොරියානු මානව සම්පත් ආයතනය විසින් පරීක්ෂා කර අනුමත කිරීම මේ වනවිට ආරම්භ කර ඇත.

එබැවින්,ඔබගේ විදේශගත වීමට අදාළ කටයුතු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් නොපමාව පිළියෙල කරනු ලබන බවත්,එම අවස්ථාව ලැබෙන තෙක් ඔබ COVID-19 ආසාදිතයෙකු බවට පත් නොවී ආරක්ෂාකාරී ලෙස නිවස තුළම රැඳී සිටිමින් ස්වයං නිරෝධායන තත්ත්වයෙන් කටයුතු කිරිමට වගබලා ගන්නා ලෙසත් මෙයින් දැනුම් දෙමි.